**නැෂනල් ජෙම් ඇන්ඩ් ජුවෙලරි ඔතෝරිටි - ලංකා ජෙමොලොජිකල් ලැබෝරටරි ප්‍රයිවට් ලිමිටඩ් - 2017/2018**

---

නැෂනල් ජෙම් ඇන්ඩ් ජුවෙලරි ඔතෝරිටි - ලංකා ජෙමොලොජිකල් ලැබෝරටරි ප්‍රයිවට් ලිමිටඩ් හි ("සමාගම") 2014 අප්‍රේල් 01 සිට 2018 මාර්තු 31 දක්වා කාලය තුළ කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතෙහි අංක 150 (1) වගන්තිය අනුව 2015, 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වාද ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්ථිත්වයන් (SLFRS for SMEs) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ( "Board") වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED / 12 හි 6.5.1 වගන්තිය අනුව, කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේවුවද, 2015, 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය දක්වාද ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 පොත්පත් හා ගිණුම් පවත්වාගෙන යාම**

---

2014 අප්‍රේල් 01 දින සිට 2018 මාර්තු 31 දින දක්වා වූ කාලය සඳහා සමාගම විසින් නඩත්තු කල යුතු පහත සඳහන් පොත් සහ වාර්තා සමාගම විසින් නඩත්තු කර නොතිබුණි.

- **(i)** මුදල් / බැංකු පොත්.
- **(ii)** ලෙජර ගිණුම්.
- **(iii)** වාර සඟරා.
- **(iv)** බැංකු සැසඳුම් ප්‍රකාශන.
- **(v)** අදාළ ලේඛන.
- **(vi)** ගෙවීම් වවුචර්

**2.3 වත්කම් හා වගකීම්**

---

සමාගම විසින් පිළියෙල කරන ලද 2014 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| **වත්කම්** | **රු.** |
| ජංගම වත්කම් | 139,006,695 |
| **මුළු වත්කම්** | **139,006,695** |
| **හිමිකම** | |
| ප්‍රාග්ධන හා සංචිත | 124,178,950 |
| **වගකීම්** | |
| ජංගම වගකීම් | 14,827,745 |
| **මුළු හිමිකම හා වගකීම්** | **139,006,695** |
| මුළු ආදායම | - |
| මුළු වියදම | 257,271 |
| ඌනතාවය | **(257,271)** |

**2.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2016 මාර්තු 28 දින සිට 2016 ජූනි 28 දිනෙන් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා ස්ථාවර තැන්පතු අළුත්කිරීමේ නිවේදනය, 2018 මාර්තු 31 දිනට රු. 862,904 ක් වූ අතැති මුදල් සඳහා ශේෂ සනාථ සහ බැංකු ගිණුමේ මුදල් ආපසු ලබා ගැනීම් පිළිවෙලින් රු. 59,000 ක් හා රු. 1,200,000 සඳහා වන සම්බන්ධිත ලිපිලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)** විදේශීය සංචාර 3 ක් සම්බන්ධයෙන් අදාළ අනුමතිය, වියදම් විස්තර සහ වෙනත් අදාළ ලියකියවිලි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

**3.1.1 මෙහෙයුම් සහ සමාලෝචනය**

2008 වර්ෂයේදී සමාගම පිහිටුවන ලදී. සමාගමේ සංස්ථා ප්‍රකාශනයේ 4 වැනි ඡේදයෙහි පහත දැක්වෙන අරමුණු පෙන්වනු ලැබුවත් කිසිදු මෙහෙයුම් ක්‍රියාකාරකමක් මේ දක්වා ආරම්භ කර නොතිබුණු අතර එම නිසා සමාගම අරමුණු සාක්ෂාත් කර නොතිබුණි.

**(i)** මැණික්, වටිනා සහ අර්ධ වටිනා ගල්, කෘතිම ගල් , ලෝහ, ඛනිජ, ස්වර්ණාභරණ, සහ වෙනත් ඕනෑම ද්‍රව්‍යයක් හෝ ඕනෑම දෙයක් සම්බන්ධයෙන් අදහස්, තක්සේරු සහතික, වාර්තා යනාදිය නිකුත් කිරීම සඳහා ජාත්‍යන්තර තත්ත්වයේ රසායනාගාරයක් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

**(ii)** විද්‍යාත්මකව, සාධාරණව සහ අපක්ෂපාතීව ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාවට තම මෙහෙයුම් වලදී එම රසායනාගාරය කෙරෙහි විශ්වාසය තැබීම සඳහා එම රසායනාගාරයේ ස්වාධීනත්වය තහවුරු කිරීම.

**(iii)** ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ශක්තිමත් කිරීම, ධෛර්යමත් කිරීම සහ සංවර්ධනය කිරීම සහ එම කර්මාන්තයේ කාර්යයන්හි සදාචාරාත්මක මෙහෙයවීම.

**(iv)** මැණික්, වටිනා හා අර්ධ වටිනා ගල්, කෘතිම ගල්, ලෝහ, ඛනිජ ද්‍රව්‍යය, ස්වර්ණාභරණ සහ වෙනත් ද්‍රව්‍යය හෝ වෙනත් දේවලට අදාළව අධ්‍යාපනික හා පුහුණු පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් වැනි දෑ පැවැත්වීම.

**(v)** මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා නව තාක්ෂණික ක්‍රම, පද්ධති, යන්ත්‍රෝපකරණ, උපකරණ, මෙවලම් සහ උපකරණ සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම .

**(vi)** සහෝදර සංවිධාන සමග අන්‍යෝන්‍ය සබඳතා ඇති කරගැනීම සහ එවැනි සංවිධාන සමඟ එක්ව, සහයෝගයෙන් සහ එකමුතුව වැඩ කිරීම.

**3.2** කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා 2016 අගෝස්තු 16 දිනැති අංක 16 /1589 /704 /040 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් අනුමැතිය ලබා දී තිබුණද සමාගම විසින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

**(i)** 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන අනුව 2008 මැයි මස පිහිටුවන ලද සමාගම විසුරුවා හැරීම.

**(ii)** සමාගමට මාරු කළ අරමුදල් සහ පොලිය ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අරමුදලට නැවත මාරු කිරීමට.

**(iii)** ඉහත මාරු කළ අරමුදල් භාවිතා කරමින් 1993 අංක 50 දරන පනත යටතේ අන්තර්ජාතික වශයෙන් පිළිගත් උසස් අති නූතන තාක්ෂණික මැණික් රසායනාගාරයක් පිහිටුවීම.

(ආ) 2014 සැප්තැම්බර් 25 දිනට බැංකු ශේෂය රු. 714,335 ක් වුවද රු. 900,000 ක මුදලක් මුදල් චෙක්පතකින් ආපසු ලබාගෙන තිබුණි. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව රු . 185,665 ක මුදලක් වැඩිපුර ආපසු ලබාගෙන තිබුණි.

(ඈ) සමාගම විසින් ආදායම් බදු සඳහා ලියාපදිංචි වීම හෝ ආදායම් බදු ගෙවීම සඳහා විගණිත දිනය දක්වා කටයුතු කර නොතිබුණි. 2014 මාර්තු 31 දිනට ගෙවිය යුතු ආදායම් බදු ශේෂය සහ රඳවාගැනීමේ බදු මුදල පිළිවලින් රු .14,619,695 ක් සහ රු. 4,784,831 ක් පියවීමෙන් තොරව රඳවාගෙන තිබුණි.

(ඈ) 2014 සැප්තැම්බර් 03 දින එක් වර්ෂයක කාලයක් සඳහා ආයෝජනය කර තිබූ රු.137,898,698 ක ස්ථාවර තැන්පතු මුදලක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගෙන කල්පිරීමට දින 21 කට පෙර ආපසු ගෙන ජංගම ගිණුමට මාරුකර තිබුණි.

රු. මිලියන 120 ක් නැවත ආයෝජනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ආවරණ අනුමැතිය ලබාගෙන තිබුණු නමුත් එදිනම රු. මිලියන 110 ක් පමණක් නැවත ආයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, ජංගම ගිණුමට මාරු කළ වටිනාකමින් රු. මිලියන 24 ක් වසර 4 කට අධික කාලයක් පුරා නිශ්ක්‍රියව පැවතිණි.

(ඉ) 2014 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන අනුව 2014 මාර්තු 31 දිනට ගෙවිය යුතු විගණන ගාස්තුව රු. 208,050 ක් විය. කෙසේ වුවද, ශේෂ පත්‍ර දිනයෙන් පසු රු. 218,706 ක් විගණන සමාගමට ගෙවා තිබුණි.

(ඊ) 2014 වර්ෂයේ දී සමාගමේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය නිල විදේශ සංචාර 3 කට සහභාගී වී තිබුණු අතර රු. 2,939,375 ක් වියදම් වශයෙන් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(i)** සභාපතිවරයා හා එක් අධ්‍යක්ෂවරයෙකු හැර අනෙක් අධ්‍යක්ෂවරුන් විසින් ඉහත සඳහන් සංචාර සඳහා භාණ්ඩාගාරයේ සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**(ii)** චාරිකා වැඩසටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු බැවින් එම සංචාරවල අරමුණු අනාවරණය කර ගැනීමට නොහැකි විය.

**(iii)** 2010 ජුලි 9 දිනැති අංක CA / 1/16/1 දරන ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛයට අනුව සංචාරය නිමවී සති 02 ක් ඇතුළත නිලධාරීන් විසින් චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය භාවිතා කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. නමුත් ඉහත සඳහන් විදෙස් සංචාර සඳහා සමාගමේ නිලධාරීන් විසින් අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**(iv)** ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 11.1 උප පරිච්ඡේදයට අනුව, සියලුම නිලධාරීන් විසින් ගුවන් ගමන් මගින් ගමන් කිරීමේදී පිරිමැසුම්දායී පන්තියේ ගමන් කළ යුතු අතර, මෙම අවශ්‍යතාවයට පටහැනිව සභාපතිවරයා ජර්මනියට හා තායිලන්තයට සංචාරය කිරීමේදී ව්‍යාපාරික පන්තියේ ගමන් කර තිබුණි . එහි ප්‍රතිඵලයක් වශයෙන් එම චාරිකා 02 සඳහා රු.257,699 ක මුදලක් වැඩියෙන් ගෙවීමට සිදුව තිබුණි.

**(v)** විදේශීය සංචාර 3 කට අදාල දීමනා සහ ගාස්තු වශයෙන් අදාළ අධ්‍යක්ෂවරුන් වෙත සමාගමේ අතැති මුදල් වලින් එකතුව රු .1,287,948 ක මුදලක් ගෙවා තිබූ අතර එම ගෙවීම් අදාළ ගෙවීම්ලාභීන් විසින් තහවුරුකර ද නොතිබුණි.

**(vi)** සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂවරයෙකු වෙනුවෙන් තායිලන්ත හා ජර්මනිය සංචාරවලට සඳහා අදාළ සංයුක්ත දීමනා සහ අනියම් දීමනා, ගුවන් ගාස්තු සහ වීසා ගාස්තු සඳහා පිළිවෙලින් රු. 369,440 ක් සහ රු .1,032,887 ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ගෙවා තිබුණි.